# 多言語情報コーナー　　　　　　　　（令和８年　４月号）

## 1. සකුරා මල් උත්සව සහ සකුරා මල් නැරබිය හැකි ප්‍රසිද්ධ ස්ථාන පිළිබඳව

ලග ලග සකුරා මල් පිපෙන සමය පැමිණ ඇත! නගරයේ සකුරා මල් උත්සව සහ ප්‍රසිද්ධ සකුරා මල් නැරඹුම් ස්ථාන පිළිබඳ හැඳින්වීමක් පහත සිදුකරනු ලැබේ.

පළමුව, සකුරා ගස් 4,000 ක පමණ සකුරා මල් පිපෙන "ඕහිරා කන්දේ ඇති සකුරා මල් උත්සවය" ඇත. එය මාර්තු මස 20 සිට අප්‍රේල් මස 12 දක්වා පැවැත්වේ. ජපානයේ හොඳම සකුරා මල් නැරඹුම් ස්ථාන 100 න් එකක් ලෙස ඕහිරා කන්ද නම් කරනු ලබන අතර, එහිදී ප්‍රසිද්ධ දේශීය ආහාර වර්ග තුනක් වන දන්ගො (සහල් වලින් සාදන ආහාරයකි), යකිතොරි (ග්‍රිල් කළ කුකුල් මස් කූරු) සහ තමාගොයකි (රෝල් කළ ඔම්ලට්)යන රසවත් ආහාර රසවිඳිය හැක. සකුරා මල් පිපෙන තත්වය අනුව රථවාහන සීමා ක්‍රියාත්මක කරනු ලැබේ.දර්ශනීය මාර්ගයේ එක් දිශාවකට පමණක් ගමන් කල හැකි අතර, මෙම කාලය තුළ වාහන නැවැත්වීම සඳහා වාහන නැවැත්වීමේ ගාස්තුවක් අය කරනු ලැබේ.

මල් පිපෙන තත්ත්වය අනුව දිනයන් වෙනස් විය හැකි නමුත් "ඔහිරා සකුරා මල් උත්සවය" මාර්තු මස 27වැනිදා සිට අප්‍රේල් මස 12 දක්වා පැවැත්වේ. ස්ථානය ලෙස ඕහිරා ක්‍රීඩා උද්‍යානය ඉදිරිපිට සකුරා වීදිය සහ ඕහිරා ක්‍රීඩා උද්‍යානය තුළ ඇති සකුරා වනාන්තරය වේ. උත්සව කාලය තුළ, සකුරා මල් සවස 6 සිට රාත්‍රී 9 දක්වා විදුලි ආලෝකය මගින් ආලෝකමත් කරනු ලැබේ.

මාර්තු මස 30 වැනිදා සිට අප්‍රේල් මස 5 වැනිදා දක්වා "ෆුජියෝකා සකුරා මල් උත්සවය" ෆුජියෝකා වතරසේ ක්‍රීඩා උද්‍යානයේදී පැවැත්වේ. මෙම කාලය තුළ, සකුරා  මල් ගස් සවස 6 සිට රාත්‍රී 9 දක්වා ආලෝකමත් වේ.

මියා නගරයේ හි මියා පාලම අවට ප්‍රදේශයේ  නගානෝ ගඟ දෙපස ගස් 500 ක පමණ දර්ශනීය සකුරා මල් ඇති අතර මෙය "මියා සකුරා මල්" ලෙස ප්‍රසිද්දියට පත්ව ඇත .

මාර්තු මස 28 සහ 29 යන දිනවල "ඉබුකි නො සතො සකුරා උත්සවය" පැවැත්වෙන අතර, එහි වේදිකාවක් මත විවිධ අංග සහ වෙළඳ භාණ්ඩ අලෙවිය ද  ඇතුළත් වේ.

නිෂිකාතා නගරයේ හි ඔමොයිගාවා ගං ඉවුරේ ඇති සකුරා ගස් 200 ක් පමණ පේළියේ ඇති දර්ශනීය සකුරා මල්  "කනසකි සකුරා මල්" ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත." නිෂිකාතා කනසකි සකුරා මල් උත්සවය" අප්‍රේල් 4 සිට අප්‍රේල් 12 දක්වා පැවැත්වේ. උත්සවය අතරතුර, සකුරා මල් ගස් සවස 6 සිට රාත්‍රී 8 දක්වා ආලෝකමත් කෙරෙන අතර, අප්‍රේල් 5 වන දින වෙළඳ කුටි සහ විවිධ විනෝද අංග පවත්වනු ලැබේ.

# 多言語情報コーナー　　（令和８年　４月号）

අවසාන වශයෙන්, "ඉවාණුන් සකුරා මල් උත්සවය" මාර්තු 29 වන දින පෙ.ව. 10:00 සිට ප.ව. 3:00 දක්වා ඉවාණුනේ පොදු ක්‍රීඩා උද්‍යානයේදී පැවැත්වේ. වේදිකා මත සිදුකරන විවිධ විනෝද අංග සහ ආහාර කුටි පැවැත්වෙනු ඇත.

කරුණාකර තොචිගි නගරයේ ප්‍රසිද්ධ සකුරා මල් පිපෙන ස්ථාන වෙත ගොස් සකුරා මල් අසිරිය දැක බලා ගන්න!

## 2. ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික පිලිබඳව දැනුවත් කිරීම

වයස අවුරුදු 20 සිට 59 දක්වා ජපානයේ පදිංචිකරුවන් ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් කර ඇත. ජපන් සහ විදේශීය ජාතිකයන් යන සියලු අය සඳහා දෙනාටම මෙම නීතිය සමාන වේ. රක්ෂණ වාරික මාසිකව ගෙවනු ලැබේ.ඔබගේ 60 වන උපන්දිනයට මාසයකට පෙර දක්වා වාරික ගෙවීම් සිදු කල යුතුය.

ඔබ යම් සමාගමක සේවය කරන්නේ නම් "සේවක විශ්‍රාම වැටුප් රක්ෂණයට" ඇතුළත් කරන අතර රක්ෂණ වාරික ස්වයංක්‍රීයව ඔවුන්ගේ වැටුපෙන් අඩු කරනු ලැබේ. ඔබ සමාගමක සේවය නොකරන අයකු නම් "ජාතික විශ්‍රාම වැටුපට" ඇතුළත් විය යුතු අතර ඔවුන් ජාතික විශ්‍රාම වැටුප් වාරිකය තමන් විසින් ගෙවිය යුතුය.

ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික මුදල සෑම වසරකම වෙනස් වේ.2026 වසර සඳහා (රෙයිවා 8 ) මාසික වාරිකය ලෙස යෙන් 17,920 වේ. අදාල ගෙවීම් පත්‍රිකාව අප්‍රේල් මස මුලදී ජපන් විශ්‍රාම වැටුප් සේවයෙන් තැපැල් මාර්ගයෙන් ඔබට ලැබෙනු ඇත. කරුණාකර සෑම මසකම වාරිකය ඊළඟ මාසය අවසන් වන විට ගෙවිය යුතුය.

ඔබ ඔබේ රක්ෂණ වාරිකය නොගෙවන්නේ නම්, ඔබට විශ්‍රාම වැටුපක් නොලැබෙනු ඇත.තවද ඔබ අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක් විශ්‍රාම වැටුප් ගෙවා ඇත්නම් වයස අවුරුදු 65 සිට විශ්‍රාම වැටුපක් ලබා ගත හැකිය. විදේශිකයන් ජපානයෙන් පිටව යන විට, ඔවුන්ට "එකවර මුදල් ආපසු ගැනීමේ ගෙවීමක්" ලෙස ඔබ විසින් ගෙවා ඇති විශ්‍රාම වැටුප් දායක මුදලෙන් යම් කොටසක් ආපසු එකවර ගෙවනු ලැබේ.

අඩු ආදායම් ලබන සිසුන් හට "ශිෂ්‍ය ගෙවීම් නිදහස් කිරීම" යන ක්‍රමය යටතේ ගෙවීම් තාවකාලිකව කල් දැමීමට ඉඩ සලසනු ලැබේ.ඒ සඳහා කරුණාකර නගර ශාලාවේ හෝ ශාඛා කාර්යාලයක රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශයෙන් විමසන්න.

ඊට අමතරව, ඔබට මුදල් ගෙවීමට අපහසු නම්, ඔබගේ ගෙවීම් නිදහස් කිරීමේ ක්‍රමයක් ඇති බැවින් කරුණාකර ඔබේගේ ප්‍රදේශයේ නගර ශාලාවෙන් විමසන්න.

**3. නගර ශාලා සේවා කවුන්ටරවල වේලාවන් දීර්ඝ කිරීම පිලිබඳව**

තෝචිගි නගර ශාලාව පුරවැසියන්ට සේවාවන් වඩාත් පහසු කිරීම සඳහා නිතර භාවිතා කරන සේවා කවුන්ටරවල ක්‍රියාකාරී වේලාවන් දීර්ඝ කරනු ලබන අතර කරුණාකර මෙම සේවාවන් භාවිතා කිරීමට වගබලා ගන්න.

නගර ශාලා ප්‍රධාන ගොඩනැගිල්ල පුරවැසි ජීවිත අංශයේ සහ රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශයේ කවුන්ටරවල වේලාවන් සෑම බදාදා දිනකම සවස 5:15 සිට සවස 7:00 දක්වා දීර්ඝ කර ඇත.

ඕහිරා, ෆුජියෝකා, සුගා, නිෂිකාතා සහ ඉවාෆුනේ යන සාමාන්‍ය ශාඛා කාර්යාල සෑම මසකම දෙවන බදාදා දින ඔවුන්ගේ කවුන්ටර වේලාවන් දීර්ඝ කර ඇත.

තවද, මයි නම්බර් කාඩ්පතක් ඇති අයට පහසුව සඳහා කොන්බිනි වෙළඳසැල්වල ස්ථාපනය කර ඇති බහුකාර්ය පිටපත් යන්ත්‍රවලින් සහතික ලබා ගත හැකිය. භාවිත කල හැකි වේලාවන් පෙ.ව. 6:30 සිට ප.ව. 11:00 දක්වා වේ.